දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :- 06/2006

සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## ජාතික අත්පිටපත් තරගය - 2026

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ලේඛන කලාවට පිවිසීමට අපේක්ෂිත නවක ලේඛක ලේඛිකාවන් දිරිගැන්වීමේ අරමුණින් යුතුව, 2026 වර්ෂයේ දී ජාතික අත්පිටපත් තරගයක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍ය ත්‍රිත්වයෙන් සංවිධානය කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව, ජාතික අත්පිටපත් තරගාවලිය වෙනුවෙන් 2022 වසරේදී අවසන් වරට නිකුත් කරන ලද චක්‍රලේඛය මෙයින් අවලංගුවේ.

2026 ජාතික අත්පිටපත් තරගය සඳහා වලංගු තරග කොන්දේසි පහත දැක්වේ.

01. අදාළ විෂයන්

    I. නවකතා,
    II. කෙටිකතා,
    III. පද්‍ය සංග්‍රහ
    IV. යොවුන් නවකතා
    V. ළමා කතන්දර
    VI. විද්‍යා ප්‍රබන්ධ
    VII. ජනශ්‍රැති
    VIII. විචාර ග්‍රන්ථ (සාහිත්‍ය/සිනමා)
    IX. ශාස්ත්‍රීය හා පර්යේෂණ ග්‍රන්ථ - (නර්තන, සංගීත, චිත්‍ර, මූර්ති, සිනමා, ඡයාරූප, නාට්‍ය,ජන සන්නිවේදනය, පුරාවිද්‍යාව, ඉතිහාසය, ආගමික)

02. අයදුම්කරුවෙකුට එක් තරග අංශයකට හෝ සියලුම තරග අංශ සඳහා ඉදිරිපත් විය හැකි අතර එක් තරග ශීර්ෂයක් යටතේ ඉදිරිපත් කළ හැකි වන්නේ එක් නිර්මාණයක් පමණි. සියලුම අත්පිටපත් පහත දැක්වෙන පරිදි පරිගණකගත කර තිබිය යුතු අතර මුද්‍රණය සඳහා නිර්දේශ වුවහොත් එහි මෘදු පිටපත අප වෙත ලබාදිය යුතුය .

    - අක්ෂර වර්ගය (Font Type) - FM අභය
    - අකුරු ප්‍රමාණය(Font Size) - 12
    - පිටු 50 කට නොඅඩු සහ පිටු 500 නොවැඩි
    - පිටු 400 කට වඩා අඩු වන්නේ නම් අත්පිටපත A5 ප්‍රමාණයට අනුව පිටු සකස් කර තිබිය යුතුය. (Page Setup)
    - පිටු 400 කට වඩා වැඩි වන්නේ නම් අත්පිටපත A4 ප්‍රමාණයට අනුව පිටු සකස් කර තිබිය යුතුය. (Page Setup)
    - අත්පිටපතට චිත්‍ර හෝ ඡායාරූප ඇතුළත් කරන්නේ නම් චිත්‍ර සියල්ල ස්කෑන් (scan) කර තිබිය යුතු අතර මුද්‍රණය සඳහා නිර්දේශ වුවහොත් එහි මෘදු පිටපත අප වෙත භාර දිය යුතුය.

CamScanner

03. චිත්‍ර සහිත ළමා කතන්දර අත්පිටපත් A4 ප්‍රමාණයෙන් පිටු සකස් කර තිබිය යුතුය (Page Setup). සාමාන්‍යයෙන් කුඩා ළමයින් සඳහා (වයස අවු 10 හෝ ඊට අඩු ) අකුරු ප්‍රමාණය(Font Size) - 14 හෝ 16 යොදා ගත යුතුය. අනෙකුත් වයස් කාණ්ඩවල චිත්‍ර සහිත ළමා කතන්දර සඳහා අකුරුවල ප්‍රමාණය සුදුසු පරිදි යොදාගත හැකිය.චිත්‍ර සියල්ලම නියමිත වර්ණ සහිතව උසස් ප්‍රමිතියෙන් යුතුව පරිගණකයෙන් හෝ අතින් ඇඳ තිබිය යුතු අතර කිසිදු හේතුවක් <u>නිසා පාට පැන්සල්,පැස්ටල් භාවිත නොකළ යුතුය</u>. අතින් අඳින ලද චිත්‍ර සියල්ල ස්කෑන් කර අත්පිටපතට ඇතුළත් කර තිබිය යුතුය. ළමා කතන්දර අත්පිටපත කවරය නොමැතිව පිටු 16 ට නොඅඩු විය යුතුය.

04. මෙම තරගය වයස් සීමාවකින් තොර ආධුනික ලේඛක ලේඛිකාවන් දිරිගැන්වීම සඳහාම පමණක් බව සලකනු මැනවි. ***" මෙහිදී ආධුනික ලේඛකයකු වශයෙන් අදහස් වන්නේ මෙතෙක් කිසිදු විෂය ක්ෂේත්‍රයක සිය නිර්මාණ මුද්‍රණාද්වරයෙන් එළි දක්වා නොමැති ලේඛකයෙකු බව යන්නයි "*** . තරගකරු ආධුනික ලේඛකයෙකු නොවන බව අනාවරණය වුවහොත් අයදුම්කරු තරගය සඳහා ඉදිරිපත් වීමට නුසුදුස්සෙක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

05. අත්පිටපතේ සඳහන් විය යුත්තේ එම නිර්මාණයේ නම පමණි. ඔබගේ නම හෝ සංකේත අත්පිටපතෙහි කිසිදු තැනක සඳහන් නොකළ යුතුය පිදුම, පෙරවදන, පසුවදන අත්පිටපත සමඟ ඉදිරිපත් නොකළ යුතුය. මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කරන ලද අයදුම්පතක් මගින් ඔබගේ තොරතුරු පැහැදිලිව සඳහන් කළ යුතුය. (ඇමුණුම 01)

06. මෙම තරගය සඳහා ආධුනික ලේඛකයින් විසින් ඉදිරිපත් කරනු ලබන අත්පිටපත් සිංහල,දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වය නියෝජනය වන විෂය ප්‍රාමාණිකයන්ගෙන් සමන්විත ග්‍රන්ථ විනිශ්චය මණ්ඩලයක් විසින් විනිශ්චය කරනු ඇත. විනිශ්චය මණ්ඩලයේ නිර්දේශ මත ලබාගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත මුද්‍රණය සඳහා අත්පිටපත් තෝරාගනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා නියමිත වර්ෂයට වෙන්වී ඇති මුල්‍ය ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් මුද්‍රණය කරනු ලබන අත්පිටපත් ප්‍රමාණය තීරණය කරනු ඇත.

07. අයදුම්කරු ආධුනික ලේඛකයෙකු බවත්, මීට පෙර කිසිදු විෂයක් යටතේ කෘතියක් මුද්‍රණාද්වාරයෙන් එළිදක්වා නොමැති බවත්, තරග කොන්දේසි කඩකළහොත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ගන්නා ඕනෑම තීරණයකට එකඟ වන බවටත් දිව්රුම් ප්‍රකාශයක් මගින් සනාථ කළ යුතුය. දිව්රුම් ප්‍රකාශ එකක් සමඟ අත්පිටපත් 03 ක් එවිය යුතුය.

08. විනිශ්චය මණ්ඩලය විසින් යම් අත්පිටපතක් මුද්‍රණය සඳහා තෝරා ගනු ලැබුවහොත් , එහි ප්‍රකාශන අයිතිය වසරක කාලයක් සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා ද්විපාර්ශ්වික ගිවිසුමකට එළඹිය යුතුය. ද්විපාර්ශ්වික ගිවිසුමට අනුව එකඟ වූ පිටපත් සංඛ්‍යාවේ මිලෙන් 10% ක වටිනාකමට සරිලන පොත් ප්‍රමාණයක් කර්තෘ භාගය වශයෙන් මුද්‍රණ කටයුතු අවසන් වූ වහාම ලේඛකයාට එකවර ප්‍රදානය කෙරේ.

09. විනිශ්චය මණ්ඩලය විසින් යම් අත් පිටපතක් මුද්‍රණය සඳහා තෝරාගත හොත් අත්පිටපතෙහි නම වෙනස් කිරීමට, සංස්කරණය කිරීමට, අමතර කොටස් එකතු කිරීමට හෝ අත්පිටපතෙහි සඳහන් කොටස් ඉවත් කර නැවත කොටස් එක් කිරීමට කිසිදු ආකාරයකින් අවස්ථාවක් නොලැබෙන අතර, එවැනි ඉල්ලීම් සලකා නොබලන බවත්, එසේ ඉල්ලීම් කරනු ලැබුවහොත් ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව වුවද ප්‍රතිඵල අවලංගු කිරීමේ අයිතිය සංස්කෘතික අධ්‍යක්ෂ සතුවේ.

10. ඔබගේ අත්පිටපත ජයග්‍රහණය කර මුද්‍රණය සඳහා තෝරාගත් පසු නැවත වාරයක් ආධුනික නිර්මාණකරුවෙකු ලෙස අත්පිටපත් තරගයට ඉදිරිපත් වීමේ අවස්ථාවක් නොමැති අතර එවැනි නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

CamScanner

11. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයේ සමාජිකයන්ට ද, මෙම අත්පිටපත් තරගයට ඉදිරිපත් විය නොහැක.

12. එක් අත්පිටපත් නිර්මාණයක් සඳහා අයදුම්කරුවන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ නොහැක. විදේශයක සිටින අයදුම්කරුවෙකු නම් Power of Attorney බලපත්‍රයකින් බලය පවරන ලද පුද්ගලයෙකු මගින් අත්පිටපත ඉදිරිපත් කිරීම සහ ඒ හා සම්බන්ධ අනෙකුත් කටයුතු සිදුකළ යුතුය.

13. ජයග්‍රහණය කරන ලද අත්පිටපතක් අප විසින් තෝරා ගෙන මුද්‍රණයට යොමු කිරීමෙන් පසු අත්පිටපත ලබා ගැනීමට හෝ ද්විපාර්ශ්වික ගිවිසුම අවලංගු කිරීමට ඉල්ලීමක් කරනු ලැබුවහොත්, එතෙක් දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණ කටයුතු සඳහා දරනු ලැබූ වියදම් අයදුම්කරු විසින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය.

14. අයදුම්පත් භාරදීමෙන් පසු ප්‍රතිඵල නිකුත් කිරීමට පෙර අතරතුර කාලය තුළ පෞද්ගලිකව හෝ ආයතනයක් මගින් එම අත්පිටපත මුද්‍රණය කිරීම නොකළ යුතුය. එසේ කළහොත් ඉහත 13 හි සඳහන් පරිදි සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් දරනු ලැබූ මුදල අයදුම්කරු විසින් ගෙවීමට සිදුවේ.

15. ජයග්‍රාහී අත්පිටපත් මුද්‍රණය කිරීම සඳහා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු අදාළ ලේඛකයා ආධුනිකයකු නොවන බව සනාථ වුවහොත් මුද්‍රණය සඳහා වැයවූ මුදල ඔහු / ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය.

16. මුද්‍රණය සඳහා නිර්දේශ වී නොමැති ඔබගේ අත්පිටපත් 0114321095 අංකයට දුරකථන ඇමතුමක් ලබා දී සතියේ වැඩකරන දිනවල පෙ.ව 8.30 ත් ප.ව 4.00 අතර කාලයෙහි කාර්යාලයට පැමිණ ලබාගත හැකිය.

17. මෙම තරගය සම්බන්ධයෙන් විනිශ්චය මණ්ඩලයේ නිර්දේශ මත සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂකගේ තීරණය අවසන් තීරණය වශයෙන් පිළිගැනීමට අයදුම්කරුවන් එකඟ විය යුතුය.

18. ඔබගේ අයදුම්පත සහ අත්පිටපත 2026.06.30 වෙනි දිනට පෙර සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ , සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (ප්‍රකාශන අංශය), 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ඉහත ලිපිනයට ගෙනවිත් භාර දිය හැකිය. අත්පිටපත බහා එවනු ලබන කවරයේ ඉහළ කෙළවරේ **"ජාතික අත්පිටපත් තරගය-2026"** යනුවෙන් සඳහන් කළ යුතුය. තැපැලේදී සිදුවන ප්‍රමාද වීම් සහ අස්ථානගත වීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

*සැලකිය යුතුය - ග්‍රන්ථ සකස්කිරීමේ ක්‍රමවේදය සම්බන්ධව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ග්‍රන්ථ සැකස්මේ ක්‍රමවේද අත්පොත* ***https://share.google/u42bYDx9V6Dw9p1vd*** *වෙබ් සබැඳිය වෙත පිවිසීමෙන් ලබාගත හැක.*

කේ.එස්.දිල්හානි
සංස්කෘතික අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
2026 මැයි මස 06 වන දීය.

කේ.එස්. දිල්හානි
අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

CamScanner

ඇමුණුම (01)

2x2 වර්ණ
ඡයාරූපය
අලවන්න

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
ප්‍රකාශන අංශය
08 වන මහල,සෙත්සිරිපාය,බත්තරමුල්ල
විමසීම-0114321095/www.culturaldept.gov.lk

## <u>ජාතික අත්පිටපත් තරගය -2026</u>

### <u>ආදර්ශ අයදුම් පත්‍රය</u>

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :- ....................................................................................................

....................................................................................................

02. ස්ථිර ලිපිනය :- ....................................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :- ....................................................................................................

04. දුරකථන අංකය
 ජංගම :- ....................................................................................................
 නිවස :- ....................................................................................................

05. Email address (විද්‍යුත් තැපැල) :- ....................................................................................................

06. ප්‍රා.ලේ කොට්ඨාසය :- ....................................................................................................

07. දිස්ත්‍රික්කය :- ....................................................................................................

08. ඉදිරිපත් වන තරග ශීර්ෂය :- ....................................................................................................

09. අත්පිටපතේ නම :- ....................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, මේ සමඟ ඉදිරිපත් කරන අත්පිටපත් නිර්මාණය මීට පෙර තරග සඳහා ඉදිරිපත් නොකරන ලද මාගේම නිර්මාණයක් වන බවත්, මීට පෙර කිසිම මාධ්‍යයකින් හෝ කිසිම විෂය ධාරාවකින් කිසිදු කෘතියක් මුද්‍රණාද්වාරයෙන් එළිදක්වා නොමැති බවත්, මෙම තරගාවලිය සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් පනවා ඇති තරග කොන්දේසි පිළිගැනීමට එකඟ වන බවත්, ආධුනිකයෙක් නොවන බව හැඟී ගියහොත් මුද්‍රණය සඳහා දරන ලද පිරිවැය ගෙවීමට එකඟ වන බවත්, එකී තරග කොන්දේසි කඩකර ඇති බවට ඔප්පු වුවහොත් මාගේ ප්‍රතිඵල අවලංගු කිරීමට එකඟ වන බවත්, මෙයින් සහතික කරමි.

| | |
|---|---|
| ........................................ | ................................ |
| දිනය | අත්සන |

CamScanner